# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2019 නොවැම්බර් මස 15 වන දින

## II වන කොටස

## අතිරේකය

(2019.11.18 දින නිකුත් කරන ලදී)


## පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) (සංශෝධන)

**(383 වන අධිකාරය වූ) පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

ගරු අග්‍රාමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 23.00 | තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1953 අංක 21 දරන පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) පනතේ දීර්ඝ නාමය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි දීර්ඝ නාමයේ නීතිය බලපෑම වනුයේ, දීර්ඝ නාමයේ "සභාව" යන වචනය ඉවත් කර ඒ වෙනුවට "පාර්ලිමේන්තුව" යන වචනය ඇතුළත් කිරීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ-

(i) "ලේකම්" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කිරීම;

(ii) "කාරක සභාව", "සභාව", "මන්ත්‍රීවරයකු", "පාර්ලිමේන්තු නිලධරයා" යන යෙදුම්වල අර්ථ නිරූපණ සඳහා අලුත් අර්ථ නිරූපණ ආදේශ කිරීම;

(iii) "සාමාජිකයකු වශයෙන් චර්යාව", "ඉලෙක්ට්‍රොනික", "පාර්ලිමේන්තුව", "පාර්ලිමේන්තු පරිශ්‍රය", "පාර්ලිමේන්තු කටයුතු" සහ "පළ කිරීම" යන අලුත් යෙදුම් සඳහා අලුත් අර්ථ නිරූපන ඇතුළත් කිරීම වේ.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, "ලේකම්" සහ "සභාව" යන වචන වෙනුවට "පාර්ලිමේන්තු මහ ලේකම්වරයා" සහ "පාර්ලිමේන්තුව" යන වචන ආදේශ කිරීම සහ "සභාපතිවරයා" යන වචනය ඉවත් කිරීම වේ.

***5 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, එම වගන්තියෙන් "සභාපතිවරයා" යන වචනය ඉවත් කිරීම වේ.

***6 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තිය නීතිය බලපෑම වනුයේ, එම වගන්තියේ "සභාපතිවරයා" යන වචන ඉවත් කිරීම වේ.

***7 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම, පනත් කෙටුම්පතේ 11 වන වගන්තිය මඟින් සිදුකරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***8 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ "සභාව" සහ "ලඝු ලේඛකයකු" යන වචන වෙනුවට "පාර්ලිමේන්තුව" සහ "අත් පිටපත් පිළිබඳ කාර්ය මණ්ඩල සාමාජිකයකු" යන වචන ආදේශ කිරීම වේ.

***9 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, "සභාපතිවරයා" යන වචනය ඉවත් කිරීම සහ "ලේකම්" යන වචනය වෙනුවට "පාර්ලිමේන්තු මහ ලේකම්වරයා" යන වචනය ආදේශ කිරීම වේ.

***10 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ එම වගන්තියේ "සභාපතිවරයා" යන වචනය ඉවත් කිරීම වේ.

***11 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියට 22අ, 22ආ සහ 22ඇ යන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබයි. අලුත් වගන්ති මඟින් -

(i) පැමිණිල්ලක් සිදු කිරීම සඳහා මන්ත්‍රීවරයකුට කථානායකවරයා විසින් අවසර දෙනු ලැබිය හැකි බව;

(ii) කරන ලදැයි කියනු ලබන වරදක් වන කාරණා නීතිපතිවරයා වෙත යොමු කිරීම සඳහා; සහ

(iii) යම් සිද්ධියක දී, නීතිපතිවරයා විසින් ඉල්ලීමක් ඉදිරිපත් කිරීම මඟින් ඉල්ලීම නිසි පරිදි ඉදිරිපත්කර ඇති බවට තීරණාත්මක සාක්ෂියක් ගොඩනගනු ලබන බව,

යන කරුණු සඳහා විධිවිධාන සලස්වනු ලබයි.

*12 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ "අධිකරණ ආඥාපනතේ 49 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 36 වන ව්‍යවස්ථාව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීම වේ.

*13 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය ඉවත් කරනු ලබයි.

*14 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය ඉවත් කරනු ලබයි.

*15 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම පනත් කෙටුම්පතේ 11 වන වගන්තිය මඟින් සිදුකරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*16 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ එම වගන්තියෙන් "අසුන් ගන්වන තැනැත්තා" සහ "සභාපතිවරයා" යන වචන ඉවත් කිරීම වේ.

*17 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ එම වගන්තියේ "සභාපතිවරයා" යන වචනය ඉවත් කිරීම වේ.

*18 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනයේ "ආ" වන කොටස සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, එම "ආ" වන කොටසේ 9 වන අයිතමය ඉවත්කර ඒ වෙනුවට අලුත් අයිතමයක් ආදේශ කිරීම වේ.

*19 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තිය සඳහා පොදු සංශෝධනයක් සිදුකරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ "ලේකම්", "පාර්ලිමේන්තුවේ ලේකම්", "සභාපතිවරයා" හෝ "කථානායකවරයා", සහ "ලංකාව" යන වචන වෙනුවට "මහ ලේකම්වරයා", "පාර්ලිමේන්තු මහ ලේකම්වරයා", "කථානායකවරයා" සහ "ශ්‍රී ලංකාව" යන වචන ආදේශ කිරීම වේ.

පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද)
(සංශෝධන)

එල්.ඩී.-ඕ. 1/2019

## (383 වන අධිකාරය වූ) පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2019 අංක  දරන පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1953 අංක 21 දරන පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) පනතේ දීර්ඝ නාමය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන දීර්ඝ නාමය මෙයින් ආදේශ කරනු ලැබේ:- 383 වන අධිකාරයේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

"පාර්ලිමේන්තුවේ සහ එහි මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද, මුක්තීන් සහ බලතල ප්‍රකාශයට පත්කිරීම සහ අර්ථ නිරූපණය කිරීම සඳහා ද, පාර්ලිමේන්තුවේ භාෂණයේ සහ විවාද කිරීමේ හෝ පාර්ලිමේන්තුවේ කටයුතු පිළිබඳ නිදහස සුරක්ෂිත කිරීම සඳහා ද, පාර්ලිමේන්තු වරප්‍රසාද පිළිබඳ කඩකිරීම් සම්බන්ධයෙන් දඬුවම් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; පාර්ලිමේන්තුවේ වාර්තා, පත්‍රිකා, කාර්ය සටහන්, සම්මත හෝ කටයුතු පළකිරීමේ නියුක්තව සිටින තැනැත්තන්ට ආරක්ෂාව ලබා දීම සඳහා ද වූ පනතකි."

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "ලේකම්" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කිරීමෙන්;

(2) "කාරක සභාව" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

""කාරක සභාව"යන්නෙන්, පාර්ලිමේන්තුවේ යම් කාරක සභාවක් අදහස් වේ;";

(3) "කාරක සභාව" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

""මන්ත්‍රීවරයකු වශයෙන් චර්යාව" යන්නෙන්, පාර්ලිමේන්තුවේ කටයුතුවලට අදාළ ව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් චර්යාව අදහස් වේ;";

(4) "මන්ත්‍රීවරයකු වශයෙන් චර්යාව" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

""ලේඛනය"යන්නට -

(අ) ලිඛිත, මුද්‍රිත හෝ ඉලෙක්ට්‍රොනික;

(ආ) ශ්‍රව්‍ය සහ දෘශ්‍ය පටිගත කිරීම්; සහ

(ඇ) වචන, ඉලක්කම්, සංකේත, ශබ්ද, ග්‍රැෆික් චිත්‍ර, රූපසටහන්,

ඇතුළු යම් ආකාරයකින් වන වාර්තාවක්, තොරතුරක්, සන්නිවේදනයක් හෝ ගනුදෙනුවක් ඇතුළත් වේ;

"ඉලෙක්ට්‍රොනික" යන්නට 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත යටතේ ඊට ලබා දී ඇති අර්ථය ම තිබිය යුතු ය;";

(5) "සභාව" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

""සභාව" යන්නෙන්, පාර්ලිමේන්තුවේ සභා ශාලාව අදහස් වේ;";

(6) "මන්ත්‍රීවරයකු" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

""මන්ත්‍රීවරයකු" යන්නෙන්, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු අදහස් වේ;";

(7) "සභාවේ නිලධරයා" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

""පාර්ලිමේන්තුවේ නිලධරයා" යන්නෙන්, පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා අදහස් වන අතර, ඊට ස්ථිරව හෝ තාවකාලිකව පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයට කලින් කලට පත් කරනු ලැබිය හැකි යම් තැනැත්තකු, සහ පාර්ලිමේන්තු පරිශ්‍රය තුළ කාර්යයේ නියුතු පොලිස් නිලධරයකු ඇතුළත් වේ;";

(8) "පාර්ලිමේන්තු නිලධරයා" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන යෙදුම්වල අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන්:-

""පාර්ලිමේන්තුව" යන්නෙන්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව අදහස් වන අතර ඊට කාරක සභාවක් ද ඇතුළත් වේ;

"පාර්ලිමේන්තු පරිශ්‍රය" යන්නෙන්, පාර්ලිමේන්තුවේ පාලනය යටතේ පවතින භූමි ප්‍රදේශය සහ සෑම ගොඩනැගිල්ලක් ම හෝ ගොඩනැගිල්ලක කොටසක් අදහස් වන අතර, ඊට පාර්ලිමේන්තුවේ කටයුතු හා සම්බන්ධ සපයන ලද හෝ භාවිත කරන වෙනත් සෑම ගොඩනැගිල්ලක්ම හෝ ගොඩනැගිල්ලක කොටසක් ම ඇතුළත් වේ;

"පාර්ලිමේන්තුවේ කටයුතු" යන්නට -

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විසින් හෝ පාර්ලිමේන්තුවේ නිලධරයා විසින් හෝ සභාව හෝ එහි කාරක සභා ඉදිරියට පැමිණීමට නියම කරනු ලැබ ඇති හෝ බලය ලබා දී ඇති යම් තැනැත්තකු විසින් සභාවේ හෝ එහි කාරක සභාවල කටයුතු ඉටු කිරීමේ කාර්යය සඳහා වන සභා වාරයක් අතරතුර දී කියන ලද, කරන ලද, හෝ ලියන ලද සියලු දේ;

(ආ) පාර්ලිමේන්තුවේ යම් මන්ත්‍රීවරයකුට හෝ පාර්ලිමේන්තුවේ නිලධරයාට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් සහ පාර්ලිමේන්තු නිලධරයකු වශයෙන් ඔහුගේ හෝ ඇයගේ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමට හැකියාව ලබාදීමේ කාර්යය සඳහා එම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ පාර්ලිමේන්තු නිලධරයා අතර කියන ලද, කරන ලද හෝ ලියන ලද සියලු දේ;

(ඇ) සභාව හෝ කාරක සභාවක් වෙත යම් ලේඛනයක් ඉදිරිපත් කිරීම හෝ භාරදීම; සභාවේ හෝ එහි කාරක සභාවල කටයුතු ඉටු කිරීමේ කාර්යය සඳහා හෝ ඊට ආනුෂංගික යම් ලේඛනයක් පිළියෙල කිරීම; සහ සභාවේ හෝ කාරක සභාවක නියමයක් මගින් හෝ ප්‍රකාරව යම් වාර්තාවක් ඇතුළුව ලේඛනයක් සකස් කිරීම, සෑදීම හෝ පළ කිරීම සහ එසේ සකස් කරන ලද, සාදන ලද හෝ පළ කරන ලද ලේඛනය;

(ඈ) නීතිපතිවරයා විසින් හෝ නීතිපතිවරයාට සහාය වන යම් නිලධරයකු විසින් පාර්ලිමේන්තුවේ කථානායකවරයාට හෝ මහලේකම්වරයාට දැනුම්දෙන ලද යම් මතයක් හෝ උපදෙස්,

ඇතුළත් වේ;

"පළ කිරීම" යන්නට, මුද්‍රිත ආකාරයෙන්, ශ්‍රව්‍ය සහ දෘශ්‍ය ඇතුළු ඉලෙක්ට්‍රොනික ආකාරයකින් සහ සජීවී ව හෝ පටිගත කර පසුව විකාශනය කිරීමෙන් සිදු කරනු ලබන පළ කිරීමක් ඇතුළත් වේ;";

(9) "සභාපතිවරයා" හෝ "කථානායකවරයා" යන යෙදුමේ අර්ථ නිරූපණයේ "සභාපතිවරයා" හෝ "කථානායකවරයා" යන වචන වෙනුවට "කථානායකවරයා" යන වචනය ආදේශ කිරීමෙන්.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) "ලේකම්ගේ අත්සන යටතේ සභාපතිවරයාගේ හෝ කථානායකවරයාගේ හෝ කාරක සභාවේ සභාපතිවරයාගේ විධානය මගින් නිකුත් කරනු ලබන" යන වචන වෙනුවට, "පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ අත්සන යටතේ කථානායකවරයාගේ හෝ කාරක සභාවේ සභාපතිවරයාගේ විධානය මගින් නිකුත් කරනු ලබන" යන වචන ආදේශ කිරීමෙන්;

(2) "සභාවේ සිට සැතපුම් පහක්" යන වචන වෙනුවට "පාර්ලිමේන්තුවේ සිට කිලෝමීටර් අටක්" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ "සභාපතිවරයා හෝ කථානායකවරයා" යන වචන වෙනුවට "කථානායකවරයා" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ "සභාපතිවරයා හෝ කථානායකවරයා" යන වචන වෙනුවට "කථානායකවරයා" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය ඒ වගන්තියේ, (ආ) ඡේදයේ "මේ පනතේ 26 වන වගන්තිය" යන වචන වෙනුවට "මේ පනතේ 22ආ (2) වන වගන්තිය" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය ඒ වගන්තියේ "කිසිදු මන්ත්‍රීවරයකු හෝ සභාවේ නිලධරයකු සහ කාර්ය සටහන් ගැනීමට සේවයේ නියුක්ත කර ඇති ලඝු ලේඛකයකු" යන වචන වෙනුවට "කිසිදු මන්ත්‍රීවරයකු, හෝ පාර්ලිමේන්තුවේ නිලධරයකු සහ කාර්ය සටහන් ගැනීමට සේවයේ නියුක්ත කර ඇති කිසිදු අත්පිටපත් කාර්යය මණ්ඩල සාමාජිකයකු" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "සභාපතිවරයා හෝ කථානායකවරයා" යන වචන වෙනුවට "කථානායකවරයා" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (3) වන උපවගන්තියේ "මේ වගන්තිය යටතේ සභාපතිවරයා හෝ කථානායකවරයා විසින් සාදනු ලබන නියෝගවල පිටපත් ලේකම් විසින් යථා පරිදි සහතික කරනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "මේ වගන්තිය යටතේ කථානායකවරයා විසින් සාදනු ලබන නියෝගවල පිටපත් පාර්ලිමේන්තු මහ ලේකම්වරයා විසින් යථා පරිදි සහතික කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(3) එම වගන්තියේ (4) වන උපවගන්තියේ "සභාපතිවරයා හෝ කථානායකවරයා" යන වචන වෙනුවට "කථානායකවරයා" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියේ "සභාපතිවරයාගේ හෝ කථානායකවරයාගේ නියෝග" යන වචන වෙනුවට "කථානායකවරයාගේ නියෝග" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට 22අ, 22ආ සහ 22ඇ වගන්ති ඇතුළත් කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර,ඒවා එකී ප්‍රඥප්තියේ 22අ, 22ආ සහ 22ඇ වන වගන්ති වශයෙන් බලාත්මක විය යුතු යः-

"කථානායකවරයා විසින් පැමිණිල්ලක් සිදුකිරීම සඳහා මන්ත්‍රීවරයකුට අවසර දීම.

22අ. කථානායකවරයා විසින් මේ කොටස යටතේ කරන ලදැයි කියනු ලබන වරදක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් සිදුකිරීම සඳහා යම් මන්ත්‍රීවරයකුට අවසර දිය හැකි ය.

කරන ලදැයි කියනු ලබන වරදක කාරණා නීතිපතිවරයා වෙත යොමුකිරීම.

22ආ. (1) මේ කොටස යටතේ වරදක් කරන ලදැයි කියනු ලබන අවස්ථාවක දී කථානායකවරයා විසින්, -

(අ) පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මඟින්; හෝ

(ආ) ආචාරධර්ම හා වරප්‍රසාද පිළිබඳව කාරක සභාවේ නිර්දේශය මත පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින්,

එසේ සිදුකරන ලෙස නියම කරන්නේ නම් එම කරන ලද වරද පිළිබඳ වාර්තාවක් සැපයීම සඳහා ඒ කරණා නීතිපතිවරයා වෙත යොමු කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කාරණයක් නීතිපතිවරයා වෙත යොමුකිරීමට ඇති අවස්ථාවක දී, කථානායකවරයා හෝ ඒ වෙනුවෙන් ලිඛිතව බලය පවරන ලද වෙනත් යම් මන්ත්‍රීවරයකු හෝ ඒ වෙනුවෙන් බලය පවරන ලද පාර්ලිමේන්තු මහ ලේකම්වරයා විසින්-

(අ) කරන ලදැයි කියන වරද පිළිබඳ පැමිණිල්ල සිදු කරන මන්ත්‍රීවරයාගේ ප්‍රකාශය දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් මත සටහන් කළ යුතු ය; සහ

(ආ) සාක්ෂි අදාළ වන බවට හෝ අදාළ විය හැකි බවට කථානායකවරයාගේ මතය වන වෙනත් යම් තැනැත්තකුගේ ප්‍රකාශ, දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් මත සටහන් කළ හැකි ය.

(3) නීතිපතිවරයා වෙත කාරණය යොමු කිරීමෙන් පසුව ඕනෑම අවස්ථාවක කථානායකවරයා විසින් අවශ්‍යයයි සලකනු ලබන්නේ නම් හෝ නීතිපතිවරයාගේ ඉල්ලීම මත කථානායකවරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන්නේ නම් වෙනත් යම් තැනැත්තකුගේ ප්‍රකාශයක් මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධාන යටතේ සටහන් කරනු ලැබිය හැකි ය.

(4) කාරක සභාවක් විසින් ලබා ගැනීමට නියමිත සාක්ෂි ලබා ගැනීමට හැකියාව ලබාදීමේ

කාර්ය සඳහා අදාළ වන ආකාරයට ම 10 සිට 13 දක්වා වූ වගන්තිවල සඳහන් විධිවිධාන, මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ප්‍රකාශ වාර්තා කිරීමට හැකිවීමේ කාර්ය සඳහා අදාළ කරගනු ලැබිය යුතු අතර, ඉහත කී කාර්ය සඳහා, එවැනි ප්‍රකාශයක් ලබාගැනීම සඳහා මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ හෝ බලය පවරා ඇති යම් තැනැත්තකුට කමිටුවක් හෝ එහි සභාපතිවරයා වෙත එම වගන්ති මගින් ලබා දී ඇති බලතලවලට සමාන බලතල තිබිය යුතු ය.

(5) 15 වන වගන්තියේ සිට 17 වන වගන්තිය දක්වා වන වගන්තිවල විධිවිධාන මේ වගන්තියේ (2) වන උපවගන්තියේ කාර්ය සඳහා ලබාදෙන ලද යම් සාක්ෂියකට සහ යම් සාක්ෂියක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධාන වල කුමක් සඳහන් වුව ද, මේ කොටස යටතේ වරදක් කරනු ලැබූ බවට චෝදනා ලද තැනැත්තකු ඒ වරද සම්බන්ධයෙන් ඔහුගේ කැමැත්ත නොමැතිව (2) වන උපවගන්තිය යටතේ යම් ප්‍රකාශයක් සිදු කිරීමට බැඳී නොසිටින අතර, එසේ කිරීමට බල කරනු නොලැබිය යුතු ය.

(7) වාර්තා කිරීම සඳහා නීතිපතිවරයා වෙත (1) වන උපවගන්තිය යටතේ යම් කාරණයක් යොමු කර ඇති අවස්ථාවක දී, (2) වන සහ (3) වන උපවගන්ති යටතේ ලබාගෙන ඇති සියලු ප්‍රකාශ සහිත වාර්තාව නීතිපතිවරයා වෙත යැවිය යුතු අතර, නීතිපතිවරයා විසින්, එම ප්‍රකාශ සැලකිල්ලට ගෙන, නීතිපතිවරයාගේ මතය අනුව මේ කොටස යටතේ කරන ලදැයි කියනු ලබන වරදක් පිළිබඳව මේ පනත යටතේ තව දුරටත් වූ පියවර ගැනීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි පවතී ද නැද්ද යන්න පිළිබඳව කථානායකවරයා වෙත වාර්තා කරනු ලැබිය යුතු ය;

තව ද, එම වාර්තාව තුළ පාර්ලිමේන්තුවේ දැනගැනීම සඳහා නීතිපතිවරයාගේ මතය අනුව ප්‍රකාශවල අන්තර්ගත සාක්ෂි මත ඔප්පු කරනු ලැබිය හැකි කරුණු පිළිබඳ සාරාංශයක් අන්තර්ගත විය යුතු ය.

(8) (7) වන උපවගන්තිය ප්‍රකාරව නීතිපතිවරයා විසින් කථානායකවරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී, පාර්ලිමේන්තුව විසින් එම වාර්තාව පිළිබඳව සලකා බැලීමෙන් පසුව, යෝජනා සම්මතයක් මඟින්, 23 වන වගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙස නීතිපතිවරයා වෙත නියම කරනු ලැබිය හැකි ය.

නීතිපතිවරයා විසින් ඉල්ලීමක් ඉදිරිපත් කිරීම මඟින් තීරණාත්මක සාක්ෂි ගොඩනැගෙන බව.

22ඇ. යම් සිද්ධියක දී නීතිපතිවරයා විසින් 23 වන වගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කිරීම, 22ආ වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ඉල්ලීම නිසි පරිදි ඉදිරිපත් කර ඇති බවට තීරණාත්මක සාක්ෂියක් ගොඩනගනු ලබන්නේ ය.".

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ "අධිකරණ ආඥාපනතේ 49 වන වගන්තිය" යන වචන වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය ඉවත් කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය ඉවත් කිරීම.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම*

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය එම වගන්තියේ (2) වන උපවගන්තියේ "26 වන වගන්තිය යටතේ" යන වචන වෙනුවට "22ආ වන වගන්තිය යටතේ" වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම*

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "අවස්ථාවෝචිත පරිදි අසුන් ගන්වන තැනැත්තා හෝ වේත්‍රධාරියා" යන වචන වෙනුවට "වේත්‍රධාරියා" යන වචනය ආදේශ කිරීමෙන්;

(2) "සභාපතිවරයා හෝ කථානායකවරයා විසින්" යන වචන වෙනුවට "කථානායකවරයා විසින්" යන වචනය ආදේශ කිරීමෙන්.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම*

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියේ "සභාපතිවරයා හෝ කථානායකවරයා විසින්" යන වචන වෙනුවට "කථානායකවරයා විසින්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම*

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනයේ "ආ"කොටසෙහි 9 වන අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් එම උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"9. (අ) රහසිගතව පවත්වන ලද; හෝ

(ආ) කථානායකවරයා විසින් හෝ කාරක සභාවල සභාපතිවරයා විසින් තහනම් කරන ලද,

සභාවේ හෝ පාර්ලිමේන්තු කාරක සභාවක යම් කටයුත්තක් පළකිරීම.".

*ප්‍රධාන ප්‍රඥප්තියට කරනු ලබන පොදු සංශෝධන*

**19.** (1) ප්‍රධාන ප්‍රඥප්තියේ සහ වෙනත් යම් ලිඛිත නීතියක "ලේකම්", "පාර්ලිමේන්තුවේ ලේකම්", "සභාපතිවරයා හෝ කථානායකවරයා" සහ"ලංකාව" යන වචන වෙනුවට පිළිවෙලින් "මහ ලේකම්වරයා", "පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා", "කථානායකවරයා" සහ "ශ්‍රී ලංකාව" යන වචන ආදේශ කරනු ලැබිය යුතු ය.

(2) යම් නියෝගයක, රීතියක, දැන්වීමක, නිවේදනයක, ගිවිසුමක, සන්නිවේදනයක හෝ වෙනත් ලේඛනයක, "ලේකම්", "පාර්ලිමේන්තුවේ ලිපිකරු","සභාපතිවරයා හෝ කථානායකවරයා" සහ "ලංකාව" සම්බන්ධයෙන් වන සෑම සඳහනක් ම පිළිවෙලින් "මහ ලේකම්වරයා", "පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා", "කථානායකවරයා" සහ "ශ්‍රී ලංකාව" සම්බන්ධයෙන් වන සඳහනක් ලෙස කියවා තේරුම් ගනු ලැබිය යුතු ය.

(3) ප්‍රධාන ප්‍රඥප්තියේ 3, 10, 17, 18, 20, 21, 27(2) සහ (3), 29 සහ 30 වන වගන්ති වල "සභාව" යන වචනය වෙනුවට "පාර්ලිමේන්තුව" යන වචනය ආදේශ කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**20.** මේ පනතේ, සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.